




# විසිපහයි

මීට වසර 25 කට පෙර 1996 මාර්තු 23 වෙනදා 'සමවැදුම' සම්පාදනය කරන මේ ලියුම්කරුට විශේෂ වූ දිනයක්. නො දැණුවත්ම ගී පද රචකයෙක් විදියට මව් බිමේ ගුවන් විදුලියේ මහගෙදර ලෙස සැළකෙන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවෙන් දොරට වඩින්නට වාසනාව ලැබුණේ මීට වසර විසි පහකට කලින්.

මෙල්බන් ගුවන් තොටින් වසර 2003 දී මෙ රටට පා තැබූ වෙලේ මව් බිමේ සිට හිතවත්ව සිටි ජගත් ජේ. එදිරිසිංහ සොයුරා කළ ඇරයුමේ ප්‍රතිඵලයක් 'පහන' මාසිකයේ 'සමවැදුම' ලිපිය. මේ ලිපියෙන් මා එතෙක් ලියා තිබූ ගී පිළිබඳව ඒ අත් දැකීම් ඇසුරින් සටහන් තබන්නටයි මා එදා ආරාධනා ලැබුයේ. එහෙත් ඒ සීමාවෙන් පිට අන්‍යන් ලියූ රසවත්, හරවත් ගී පිළිබඳව මා රස විඳිනා අන්දම බෙදා හදා ගන්නට මාස කීපයකට පසුව සිතූ ලෙසටයි පසු ගිය වසර 18 කට ආසන්න කාලය 'සමවැදුම' මෙලෙසින් ලියවුණේ.

ඉතින් මාගේ ගී පද රචනා සැරියේ විසි පස් වන වසර පිරෙනා මේ මොහොතේ ඒ පිළිබඳව කෙටි අතීතාවර්ජනයක යෙදෙන්නට 'සමවැදුම' ඉඩ කඩ වෙන් කර ගැනීමට මට අවසර......!

වසර 25 ක් යනු මාගේ දිවි සැරියේ නම් අඩකට මදක් අඩු කාලයකි. එනයින් ගී පද රචකයෙකු ලෙස පුනර්ජීවය ලබා ආ කාලය වයසින් අඩකට ආසන්න වෙයි. දශක දෙක හමාරක කාලය තුළ මා රචකයෙකු ලෙස කළා වූ කිසියම් දෙයක් වේ ද? එසේ නම් ඒ මොනවාද? යමක් කළා යැයි කියවෙන්නේ නම් ඒ ඇයි? මේ කියන ප්‍රශ්ණ මසිත තුළ ම නළියයි. ඒත් ඒ සඳහා පිළිතුරු ඇත්තේ මා අතේ නම් නොවේ. ගී අසන, විඳින රසිකයින් අතේය; ගී ගයනා ශිල්පී ශිල්පිනීන් අතේයි; පද ගීයට නැංවූ, සංගීත රටා තැවරූ සංගීත ශිල්පීන් අතේයි. සම්මාන, අගැයුම් කිසිත් නැති, කළ කී දේ පමණක්, යම් පමණක රසික පිරිසක් සමඟ ඉතිරිව ඇති මට ආපසු හැරී බැලීමේදී ඇත්තේ ආත්ම තෘප්තියත් යම් යම් හඳුනා ගැනීම් එකතුවකුත් පමණකි.

''ඔබ කොහොමද ගී පද රචනයට යොමු වුණේ...,?'' මේ මා වැඩිම වාරයක් පිළිතුරු සැපයූ පැණය වෙන්නට ඇති.

''ආනන්ද විද්‍යාලයේ 'අනඳ නුවණ' සංගමයේ දැන්වීම් පුවරුවට, යහළු යෙහෙළියන්ගේ සමරු පොත් වලට කවි ලිව්වා. නිවාඩුවකට ගමේ ගියා ම කවියෙන් ලියුම් ලියාගන්න යාළුවෙකු හිටියා, කපිල ජනක් සමරසේකර කියලා....''

''පස්සේ කාලෙක මේ අදහස් ගී පද රචනා රටාවට ආයෙමත් ලිව්වා. ලියලා මං කැමති ශිල්පීන්ට ශිල්පිනීන්ට ලියා පදිංචි තැපෑලෙන් යැව්වා. එයින් එකක් තමයි ආචාර්ය වික්ටර් රත්නායක මහත්මයා තනුවක් හදාගෙන, සංගීතය මුහු කරගෙන මීට අවුරුදු 25 කට කලින් ගායනා කළේ. ඒ ගුවන් විදුලියේ ස්වදේශීය අංශයෙන් ප්‍රචාරය කළ සරළ ගී වැඩ සටහනකට. ලියපු කවියක්වත් ළමයෙකුගේ හඬින්වත් ගායනා වෙනවා අහලා නොතිබුණ මට මේ සිද්ධිය හරිම දෛවෝපගතයි. පාසලේ පහේ පන්තියේ ඉන්න කාලයේ ඉඳන්ම යි රත්නායකයන්ගේ ගායනාවලට ආශක්ත වුණේ. ඒ 1971 දී 'කළණ මිතුරෝ' චිත්‍රපටයේ ගී අහලා. එදා ඉඳන් කරගෙන ආ ලොකු ගී එකතුවක් අදටත් තියෙනවා.

''ඔබ මේ වෙන කොට ගී කීයක් විතර ලියලා තියෙනවද?'' ඒ තවත් සරළ, ඒත් පහසුවෙන් පිළිතුරක් දෙන්න අමාරු ප්‍රශ්නයක්.

ලියපු පද රචනා ගණන නම් ගැණලා නෑ. ගී පද රචනා ප්‍රමාණය නම් 250 ක් විතර ඇති. ගායනා වුණොත් විතරයිනේ 'පද රචනාවක්' වෙන්නේ. 'සිසාරා' වෙබ් අඩවියේ යාවත්කිරීම්වලට අනුව නම් 210 ක් වෙලා තිබුණා පහු ගිය අවුරුද්දේ. ඒත් මේ ප්‍රමාණාත්මක බව වැදගත් ද? මගේ හිත මගෙන්ම අහනවා. ගුණාත්මක අගයක් ඇති හරවත් පද රචනා ගණනයි වඩාත් වැදගත්. ඉතින් ආයෙමත් ඒ ගැන අහන්න වෙන්නේ රසිකයිනගෙන්; විචාරකයින් ගෙන්. ඒත් රසිකයින්ට ඇහෙන්න මාධ්‍යවල ගීත ප්‍රචාරය වෙන්න ඕන. හොයලා, බලලා සදය විචාරයක් කරන විචාරකයින් ඉන්නවා ද අද?

ආචාර්ය වික්ටර් රත්නායකන් ගීත දෙකක් ම මේ විදියට කළාට පස්සෙයි අඳුනාගන්න ලැබෙන්නේ. ඒ, ඒ වෙනකොටත් පද රචනා ලියලා යවපු නිසා ම හිතවත් වෙලා හිටිය සුනිල් එදිරිසිංහ ප්‍රවීණ ශිල්පියාණන්ගේ මාර්ගයෙන්. ආචාර්ය රෝහණ වීරසිංහයන්ගේ තනු වගේ ම සංගීත නිර්මාණවලට විශාරද දීපිකා ප්‍රියදර්ශනී ශිල්පිනිය ගැයූ ගී දෙකත්, මාව රචකයෙක් විදියට රසිකයින්ට වඩාත් සමීප කරවන්නට සමත් වුණා කියලා හිතෙනවා. තවත් අතකින් දැන හඳුනාගත් විශාරද ගුණදාස කපුගේ ම ානව හිතවාදී ශිල්පියාණන් පොත පත ලබා දෙමින් කළ උපකාර පුදුමාකාර ශක්තියක් වුණා මේ කලාත්මක ගමනට.

ලයනල් රන්වලයන් සහ රන්වල බලකාය සමඟින් කරගෙන ආ ගී පද රචනා කලාට වෙනම ම මගක් ගත්තා කියලයි හිතෙන්නේ. ප්‍රසාංගිකත්වය, උපහාසය කැටි කරලා පූර්ව නිර්මිත තනුවලට පද යෙදුවේ රන්වලයන්ට තමන්ගේ පිරිස සමඟ ම වේදිකාවේ ඉදිරිපත් කරන්න පුළුවන් වෙන විදියට.

ලියා යැවූ පද රචනා තෝරාගෙන ගැයූ, විශාරද නන්දා මාලනී, සුනිල් එදිරිසිංහ, විශාරද අමරසිරි පීරිස්, ජානක වික්‍රමසිංහ, කීර්ති පැස්කුවෙල්, විශාරද නෙලු අධිකාරි, බන්දුල විජේවීර, රොඩ්නි වර්ණකුල, ආචාර්ය රෝහණ වීරසිංහ, කරුණාරත්න දිවුල්ගනේ, විශාරද රෝහණ ධර්මකීර්ති, සහන් රන්වල, විශාරද වසන්තා මධුරාංගනී, විශාරද ප්‍රදීප් මුතුකුඩාරච්චි, රොහාන් ශාන්ත බුලේගොඩ වාගේ ප්‍රවීණ ගායන ශිල්පී ශිල්පණියන් මේ වෙලාවේ සිහිපත් කරන්නේ ගෞරවයෙන්. ඒ හැරුණු විට ගායනා වලට එක් වුණ අනිකුත් සියළු ගායන ශිල්පී ශිල්පිනීන් මෙන්ම වාද්‍ය ශිල්පීන්, පටිගත කිරීමේ ශිල්පීන් මෙහිදී ස්තූතිපූර්වකව සිහිපත් කළ යුතුම වෙනවා. මගේ පදරචනා වලින්ම සංගත තැටියක් වෙනුවෙන් ගායනා කළ සරිනි දියණිය 'පිය-දියණි' එකතුවක් ලෙස තැබුවේ සදාදරණීය මතයකයක්.

මා ලියූ පද රචනා සංගීතවත් කළ සංගීතවේදීන් අතරේ ඉදිරියෙන් සිටින්නේ ආචාර්ය වික්ටර් රත්නායක, ආචාර්ය රෝහණ වීරසිංහ සහ ලයනල් රන්වල සංගීතවේදීන්. මේ තුන්පළ ඇතුළු සියළු සංගීත නිර්මාපකයින්ටත් මගේ කෘතවේදී බව පළ කරන්නේ ඉතාමත් ම සෙනෙහසින්.

'නුඹෙ සිරික්කියට' 'අතුරු මිතුරු', 'සිදංගනා', 'සිනාවී' යන මගේ ගී පද රචනා ඇතුලත් සංගත තැටි අතරට මේ රජත ජුබිලියේදී එක්වෙන්නේ 'ආදරණීයයි නම්' සංගත තැටියයි. මා ලියූ පද රචනාවලට ආචාර්ය රෝහණ වීරසිංහයන් නිර්මාණය කළ සංගීත රටා ඇතුළත් මේ නවත ම ගී එකතුව මගේ පස් වැනි සංගත තැටියයි.

මේ සියල්ල සඳහා එදා පටන් ම මුදලින් අනුග්‍රහය දුන් හිතවතුන්ටත්, ස්වේච්ඡාවෙන් ගායනාවෙන් දායක වූ සියලු ශිල්පී ශිල්පණීන්නටත් අනේක වාරයක් ස්තුතියි.



සිසිර දිසානායක